# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

## රත්මලාන පරිශ්‍රය සඳහා

## තාවකාලික පදනම මත සුළු ශ්‍රේණි සඳහා බඳවා ගැනීම

- ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
- පත්වීම් තාවකාලික පදනම මත වන අතර පැමිණීම මත පදනම් වූ දෛනික දීමනාවක් ගෙවනු ලැබේ.
- වැඩ, හැසිරීම හා පැමිණීම මත සේවයේ නැවත පිහිටුවීම් සඳහා සලකා බලනු ලැබේ.
- විශ්වවිද්‍යාලයීය ආකෘතියට අනුව පිළියෙල කල අයදුම්පත් සහතික කල අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සහතික සමඟ **ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය,** රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදිය හැකිය.
- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2023.06. 30**

### තෝරාගැනීමේ ක්‍රමවේදය

- ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල අනුව.

### පොදු කොන්දේසි

01. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

02. අයදුම්කරුවන් තෝරා ගැනීම ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව සහ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල පදනම් කරගෙන සිදු කරනු ලැබේ.

03. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

04. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය.

05. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් (**www.kdu.ac.lk**) භාගත කර ගත හැකි ආකෘතිය මගින් පමණක් අදාළ තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට දන්වා සිටිනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිබාහිරව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වීඩී කිත්සිරි
ලේඛකාධිකාරී

VD KITHSIRI
Registrar
General Sir John Kotelawala Defence University
Ratmalana

## 01. කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරු (තාවකාලික)

<u>සුදුසුකම්</u>

1. 08 වන ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය.

2. අනුපිටපත් යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර සහ අනෙකුත් කාර්යාල යන්ත්‍රවල සුළු අළුත්වැඩියා කිරීම් ඇතුළුව මෙහෙයුම් සහ නිසි නඩත්තුව පිළිබඳ අවම වශයෙන් වසර 5 ක පළපුරුද්ද.

3. වයස අවුරුදු 40 නොඉක්මවිය යුතුය.

<u>දෛනික වැටුප</u>

රු. **1,500/-**ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ. (සේවයට පැමිණීම මත, මසකට වැඩ කරන දින 20ක් සඳහා දළ වැටුප රු. **30,000/-** ක් ගෙවනු ලැබේ.)

## 02. විදුලි කාර්මික (තාවකාලික)

<u>සුදුසුකම්</u>

1. සිංහල / දෙමළ භාෂාව කියවීමට හා ලිවීමට හැකිවීම.

2. අ. ට්‍රාන්ස්ෆෝමර්, සියලුම වර්ගයේ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ වල වැරදි හඳුනාගෙන ඒවා අලුත්වැඩියා කිරීම සහ අමුද්‍රව්‍ය එකලස් කිරීම, විවිධ වර්ගයේ රැහැන් හා ඒවායේ වර්ග කිරීම්, මානක උපකරණ හා ඒවායේ භාවිතයන්, විවිධ වර්ගයේ විදුලි රැහැන් ඇදීම, මාපක සම්බන්ධ කිරීම, මාපක හා කුඩා ප්‍රමාණයේ ට්‍රාන්ස්ෆෝමර් පරීක්ෂා කිරීමට හැකියාව තිබීම.

   ආ. සටහන්, රූපසටහන් කියවීම සහ කියවා තේරුම් ගැනීම, මිනුම් කියවීම සහ අසම්පූර්ණ මිනුම් සටහන් කිරීමට හැකියාව තිබීම.

   ඇ. වෘත්තියට අදාල මෙවලම් උපකරණ භාවිතය හා පාලනය කිරීමට හැකිවීම.

3. විශ්වවිද්‍යාලයක හෝ පිළිගත් ආයතනයකින් වෘත්තියට අදාල ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ සහතිකපත් පාඨමාලාවක් හදාරා තිබීම.

4. රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක විදුලි කාර්මිකයෙකු වශයෙන් අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

5. වයස අවුරුදු 40 නොඉක්මවිය යුතුය.

<u>දෛනික වැටුප</u>

රු. **2,000/-**ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ. (සේවයට පැමිණීම මත, මසකට වැඩ කරන දින 20ක් සඳහා දළ වැටුප රු. **40,000/-** ක් ගෙවනු ලැබේ.)